**කුරුවිට ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාචනය**

කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (ඉ) සහ (ඊ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කම්කරු විවේකාගාරයේ පිරිවැය රු.637,043ක් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර සංවර්ධන ව්‍යාපෘති 04ක වියදම රු.5,541,745ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | වරිපනම් සහ අක්කර බදු හිඟහිටි අධි ගාස්තු රු.480,548ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | දෝෂසහගතව ද්විත්ව සටහන් තැබීමෙන් ලී බඩු හා සවිකිරීම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.92,400කින් වැඩියෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඈ) | ලද ආයුර්වේද ආධාර රු.103,334ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | ස්ථාවර තැන්පතු ගිණුමේ ශේෂය 2020 වර්ෂයේ සිට රු.51,664,000ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණු අතර, රු.57,724,871ක ප්‍රාග්ධන ආධාර ලැබිය යුතුව පවතින බවට එම වර්ෂයේදීම සාවද්‍ය ලෙස සටහන් තබා තිබුණි. එහෙත් 2022 වර්ෂය තුළදී හෝ එම වැරදි නිවැරදි කර නොතිබීම නිසා රු.109,388,871ක නොවිසඳුණු අවිනිශ්චිත ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුළ පැවතිණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |
| (ඊ) | ස්ථාවර තැන්පතු, ප්‍රාග්ධන ආධාර, සේවක ණය, නිරවුල් කරගත නොහැකිව පැවැති අත්තිකාරම් ගිණුම්වලට 2020 සහ 2021 වර්ෂවලදී යොදා තිබුණු රු.114,806,153ක බැර සටහන් හා රු.98,391,679ක හර සටහන් ද, එම සටහන්වල ප්‍රතිවිරුද්ධ සටහන ලෙස සමුච්චිත අරමුදලට යෙදූ සටහන් ද තථ්‍ය ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස සිදුකළ ගිණුම්ගත කිරීම් නොවුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |
| (උ) | ගිණුම් විෂයයන් 07කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.161,077,208ක වෙනසක් විය. | වරිපනම් බදු අධි ගාස්තු ගිණුම් ගත නොකිරීම එම වෙනසට හේතු වී ඇති බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.214,055ක් වූ ගිණුම් විෂයයන් 03ක් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | විස්තර සොයා ගැනීමට අපහසු බැවින් ලියා හැරීම සඳහා අනුමැතියට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගණුදෙණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී එකතු වටිනාකම රු.575,358,836ක් වූ ජ'නල් සටහන් 29ක් අනුමත කර නොතිබුණු අතර ජ'නල් වවුචර් ද පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදිව කිරීමට කටයුතු කරන බව. | සියලු ජ'නල් සටහන් විධිමත්ව අනුමත කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (5)ට පටහැනිව, 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.2,614,981ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | අත්තිකාරම් ලේඛනයෙන් කපා හැරීමට ආණ්ඩුකාරවර කාර්යාලය වෙත යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස්වලට පටහැනිව සභාවේ පරිපාලන අවශ්‍යතා නොවූ ගමන් වෙනුවෙන් රු.53,000ක් වැයකර තිබුණි. | එම වියදම් නැවත පියවන ලෙස සභාපතිවරයා වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.63,358,707ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.90,282,746 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,428,955 | 8,418,956 | 5,930,941 | 11,262,318 | 6,443,197 | 8,809,052 | 5,732,585 | 8,944,120 |
| කුලී | 9,096,117 | 9,004,731 | 8,184,746 | 1,905,021 | 8,060,294 | 7,791,836 | 8,510,419 | 1,128,171 |
| බලපත්‍ර ගාස්තු | 2,204,250 | 2,780,474 | 2,780,474 | - | 3,160,450 | 2,179,966 | 2,180,966 | - |
| වෙනත් ආදායම් | 11,288,780 | 17,431,240 | 14,210,857 | 236,468 | 10,770,730 | 36,124,577 | 34,955,353 | 180,619 |
| | 30,018,102 | 37,635,401 | 31,107,018 | 13,403,807 | 28,434,671 | 54,905,431 | 51,379,323 | 10,252,910 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 05ට වඩා පැරැණි රු.825,776ක හිඟහිටි වරිපනම් ශේෂයක් හා වසර 03කට වඩා පැරැණි රු.648,097ක හිඟහිටි අක්කර බදු ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. | ජංගම සේවා මගින් හා ක්ෂේත්‍ර පරීක්ෂා මගින් හිඟ අයකරන අතර අක්කර බදු සඳහා ඉඩම් නිශ්චය කිරීම හා ඉඩම් ගැටලු විසඳීමට ඇති බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ආ) | වර්ෂ 03කට වඩා පැරැණි හිඟහිටි කඩකුලී රු.1,149,850ක් හා දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 24කින් ව්‍යාපාර බදු රු.63,000ක් අයකර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කර 10ක් පවරා ගැනීමට සභාව විසින් 2015 වර්ෂයේදී රු. මිලියන 3.5ක් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා තිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂය | ඉඩම පවරා ගැනීම සඳහා වූ ලිපිලේඛන අවශ්‍ය ආයතන වෙත යොමු කර එම ආයතනවල ඉල්ලීම් අනුව | ඉඩම කඩිනමින් පවරා ගෙන සන අපද්‍රව්‍ය කළමනාකරණ |

| | | |
|---|---|---|
| අවසන් වනවිටත් ඉඩම පවරාගත නොහැකි වීමෙන් සහ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | නැවත නැවතත් ලිපි ලේඛන සකස් කර යොමු කර ඇති බව. | සැලැස්මකට අනුව කටයුතු කළ යුතු වේ. |

## 3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------- | ------------------------- | --------------- |
| අයිතිය සභාව සතු නොවූ කැබ් රථයක් 2015 වර්ෂයේ සිට අභාවිතව තිබී පසුව 2022 මැයි මාසයේ දී එය ගිනි තබා විනාශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව හානිය හා වගකිව යුතු අය නිශ්චය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | අධිකරණ කටයුතු අවසන් වී නොමැත. 2018 අංක 34 දරන හානිපූර්ණ කාර්යාල පනත යටතේ අලාභ අය කිරීමට ජනාධිපති කාර්යාලය වෙත යොමුකර ඇත. හානිය පිළිබඳ මු.රෙ.104 යටතේ පරීක්ෂණ සිදුකර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | --------------- |
| (අ) | 2015 වර්ෂයේදී රජයෙන් ලද බැකෝ ලෝඩරයක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ පියවර ගෙන නොතිබුණි. අබලි වාහන 03ක අලුත්වැඩියා හෝ අපහරණ කටයුතු, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි. | ලියාපදිංචි අයිතිය පවරා ගෙන නොමැති බව හා අදාළ වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කර ගෙන යන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාව සතු බොබ්කැට් යන්ත්‍රයක්, කම්පැක්ටර් යන්ත්‍රයක් සහ මෝටර් බෝට්ටුවක් වසර 07ත් වසර 10ත් අතර කාලයක සිට අභාවිතව පැවැතිණි. | බොබ්කැට් යන්ත්‍රය අවශ්‍යතාව පරිදි සේවයේ යොදවන බව, කම්පැක්ටර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව හා මෝටර් බෝට්ටුවේ එන්ජිම සම්බන්ධව පවතින නඩුව අවසන් වී නොමැති බව. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. . |

## 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------ | ------------- |
| සභාවේ නඩු කටයුතු සඳහා රු.25,000ක මාසික දීමනාවකට නීතිඥවරයෙකුගේ සේවය ලබා ගැනීමට 2021 ජූලි 16 දින පැවති | විශාල මුදලක් වැය වන නඩු කටයුතු වෙනුවෙන් නීතීඥවරයකු පත්කර ගැනීමට සහ මාසික දීමනාවක් ලබාදීමට | මාසික දීමනාවක් ගෙවා නීතිඥවරයෙකුගේ සේවය ලබා ගන්නේ නම් නඩු කටයුතු සඳහා |

| | | |
|---|---|---|
| මහා සභාවේ දී තීරණය කර එදිනම ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරව නීතිඥවරයෙකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. පසුව, 2021 ජූලි සිට 2022 දෙසැම්බර් දක්වා ඔහු වෙත රු.425,000ක් මාසික දීමනා ලෙස ගෙවා තිබුණි. එහෙත්, ඊට අමතරව එම කාලපරිච්ඡේදය වෙනුවෙන්ම සභාවේ නඩු කටයුතු සඳහා ඔහු වෙත තවත් රු.103,920ක් හා වෙනත් නීතිඥවරුන් වෙත රු.578,627ක් ගෙවා තිබුණි. | මහා සභාවේ යෝජනා ස්ථිර කර ඇති බවත් නීතිඥවරයා සමඟ ගිවිසගත් දිනට පෙර සිට ඔහු විසින් සහ අනෙකුත් නීතිඥවරු විසින් මෙහෙයවන නඩු සඳහා ගාස්තු ගෙවා ඇති බව. | අමතර ගාස්තු නොගෙවිය යුතු වේ. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------- | ----------- |
| ඉදි කිරීම් 03ක දී රු. 70,622ක් වැඩිපුර ගෙවා තිබුණි. | රු.28,942ක් සඳහා පිළිතුරු දී නොතිබුණි. ඉතිරි වැඩිපුර ගෙවීම් ආපසු ගෙවන ලෙස අදාළ සමිතිය වෙත ලිඛිතව දැනුම් දී ඇති බව. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුවේ. |